# ශූන්‍යතා දර්ශනයේ චීන පරිණාමය හා සෙන් ඩාඹ හිමියන්ගේ ශූන්‍යතා නිබන්ධය

මැදවච්චියේ ධම්මජෝති හිමි

ශූන්‍යතා යනු ථේරවාද හා මහායාන උභය ග්‍රන්ථයන්හි ම සාකච්ඡා වන ගැඹුරු දාර්ශනික සංකල්පයකි. එය ථේරවාද බෞද්ධ ග්‍රන්ථවලින් ආරම්භ වී මහායාන ග්‍රන්ථවලින් වඩාත් පෝෂණය වූවකි. දාර්ශනික අතින් මෙය ඉතා ගැඹුරින් විග්‍රහ කර ලොවට ඉදිරිපත් කරනුයේ නාගාර්ජුනපාදයන් විසින් රචිත මූලමධ්‍යමකකාරිකා නම් කෘතියෙහි. ඉන්පසු උන්වහන්සේ විසින් ආරම්භ කරන ලදැයි සැලකෙන මධ්‍යමක සම්ප්‍රදාය විසින් ශූන්‍යතා දර්ශනය නව නවත් ශාඛා ඔස්සේ විහිදුවමින් දියුණු කරන ලදි.

ක්‍රි.ව. ආරම්භයේ දී පමණ කණිෂ්ක අධිරාජ්‍යයා විසින් සිදු කරන ලද සිව්වන සංගායනාවෙන් පසු උතුරු බුදුසමයේ දේශාන්තර ව්‍යාප්තිය ආරම්භ විය. ක්‍රි.ව. 1 වන සියවසේ බුදුදහම චීනයට අවතීර්ණ වීමෙන් හා ප්‍රචාරය වීමෙන් ශූන්‍යතා දර්ශනයේ චීන පරිණාමය ආරම්භ වේ. චීනය තුළ එහි සංවර්ධනය ප්‍රධාන අංශ කීපයකට බෙදා වෙන් කර ගත හැකිය.

1. සංස්කෘත මහායාන බෞද්ධ සූත්‍ර චීන භාෂාවට පරිවර්තනය කිරීම හා එහිදී භාවිත කරන ලද සාම්ප්‍රදායික චීන දර්ශනික යෙදුම් තුළින් පිළිබිඹු වූ ශූන්‍යතා දර්ශනයේ වැරදි අර්ථ කරන (ග ඉ ෆෝ ජී ය චො- ge yi fo jiao格义佛教)
2. ඉහත සඳහන් පරිවර්තන ග්‍රන්ථ පදනම් කොට ගෙන ගොඩ නැගෙන දාර්ශනික ගුරු කුල විසින් අවබෝධ කරගත් ශූන්‍යතා දර්ශනය ලියෝ ජියා චි සොන්ග් - (liu Jia qi zong六家七宗)